# ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය
## අවුරුදු 15 න් හා අවුරුදු 17 න් පහළ ක්‍රිකට් කණ්ඩායම් මාර්ගගත ක්‍රමය ඔස්සේ ලියාපදිංචිය 2021
## slsca.batsman.com

❖ පාසල් විසින් ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමයට දැනුම් දුන් පරිදි ඒ ඒ පාසලේ කණ්ඩායම් ලියාපදිංචිය සඳහා විදුහල්පතිතුමා/තුමිය විසින් පත් කර එවන ලද ගුරුභවතුන් විසින් තම පාසලේ ක්‍රිකට් කණ්ඩායම හා ක්‍රීඩකයින් slsca.batsman.com වෙබ් පිටුවේ ලියාපදිංචි කළ යුතුය.
මෙම වසරේ 2020/2021 අවුරුදු 19 න් පහළ එක් දින ක්‍රිකට් තරගාවලිය සඳහා ලියාපදිංචි කළ ක්‍රීඩකයින් හැර අනෙකුත් සියළු ක්‍රීඩකයින් මෙහි ලියාපදිංචි කළ යුතුය.

❖ සියළුම අවුරුදු 15 න් හා 17 න් පහළ සියළු පාසල් ක්‍රිකට් කණ්ඩායම් මාර්ගගත ක්‍රමය ඔස්සේ ලියාපදිංචි කිරීම අනිවාර්ය වේ.

❖ ඒ සඳහා පළමුව සියළුම ක්‍රීඩකයින් මාර්ගගත ක්‍රමය ඔස්සේ ලියාපදිංචි කළ යුතුය.

➢ මෙම වසරේ 2020/2021 අවුරුදු 19 න් පහළ එක් දින ක්‍රිකට් තරගාවලිය සඳහා ලියාපදිංචි කළ ක්‍රීඩකයින් හැර අනෙකුත් සියළු ක්‍රීඩකයින් මෙහි ලියාපදිංචි කළ යුතුය. - (මෙවර 2020/2021 අවුරුදු 19 න් පහළ එක් දින ක්‍රිකට් තරගාවලිය සඳහා ලියාපදිංචි කළ ක්‍රීඩකයින් අප විසින් මාර්ගගත ක්‍රමය ඔස්සේ ලියාපදිංචි කර ඇති බව මෙයින් දන්වා සිටිමි)

❖ ඒ අනුව එක් එක් කණ්ඩායම් වෙන වෙනම ( Division 1 / Division 11 /Division 111 – A' B' ) ලියාපදිංචිය සිදුකර තම දිස්ත්‍රික්කය තුළ පවත්වනු ලබන මාර්ගගත ක්‍රමය ඔස්සේ ලියාපදිංචි කළ අවුරුදු 15 න් හා අවුරුදු 17 න් පහළ ක්‍රිකට් කණ්ඩායම් ලියාපදිංචිය සහතික කිරීමේ වැඩසටහන සඳහා ඉදිරිපත් කර ලියාපදිංචිය සහතික කර ගත යුතුය

❖ DIVISION 1 / DIVISION 11 තරගාවලිය සඳහා සහභාගී විය හැක්කේ එක් පාසලකින් එක් කණ්ඩායමක් පමණි.

❖ DIVISION 111 කාණ්ඩයේ තරගවැදිය හැක්කේ එක් පාසලකින් උපරිම කණ්ඩායම් 02 ක් පමණි.

❖ එක් පාසලකට තරගාවලිය සඳහා ඉදිරිපත් කළ හැක්කේ උපරිම කණ්ඩායම් 03 ක් පමණි.

**ඒ අනුව ලියාපදිංචි කළ කණ්ඩායම් පහත සඳහන් දෑ කණ්ඩායම් සහතික කර ගැනීමේදී ඉදිරිපත් කළ යුතුය.**

සියළුම කණ්ඩායම් මාර්ගගත ක්‍රමය ඔස්සේ ක්‍රීඩකයින් ලියාපදිංචි කර බාගත කරන ලද ක්‍රීඩක ලියාපදිංචි කිරීමේ පෝරමය (Player Registration Form) හා කණ්ඩායම් ලියාපදිංචි කිරීමේ පෝරමය (Team Registration Form) සෑම ක්‍රීඩකයෙකුගේම අත්සන සහිතව විදුහල්පතිතුමා / කණ්ඩායම් භාර ආචාර්යතුමා හෝ ක්‍රීඩා භාර ආචාර්යතුමා හා පුහුණුකරුගේ අත්සන සහිතව ඉදිරිපත් කළ යුතුය

1 <u>දැනට ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය විසින් නිකුත් කරනු ලැබූ ක්‍රීඩක හැඳුනුම්පතක් සහිත තම පාසලේම කලින් ලියාපදිංචි කල ක්‍රීඩකයෙකු සඳහා</u>

- මාර්ගගත ක්‍රමය ඔස්සේ ක්‍රීඩකයා ලියාපදිංචිය සිදුකර එමගින් ගනු ලැබූ ක්‍රීඩක ලියාපදිංචි පෝරමයේ පිටපත ( Player Registration Form )
- එම ක්‍රීඩකයා හට ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය විසින් නිකුත් කරනු ලැබූ ක්‍රීඩක හැඳුනුම්පත
- අගල් 2'' 2 1/2'' ප්‍රමාණයේ ඡායාරූපයක් - එහි පිටුපස එම ක්‍රීඩකයාගේ නම /ඇතුළත්වීමේ අංකය / උපන් දිනය යොදා විදුහල්පතිතුමා විසින් සහතික කර තිබිය යුතුය.(**මාර්ගගත ක්‍රමය ඔස්සේ ක්‍රීඩක ලියාපදිංචිය සඳහා බාගත කරන ලද ඡායාරූපයම විය යුතුය.)**

**ක්‍රීඩක ලියාපදිංචි පෝරමයේ පිටපත හා ඡායාරූපය ඇමුණුම් කටු (Stepler Pins )යොදා අමුණා තිබිය යුතුය.**
**(ෆයිල් කටු භාවිතා කිරීමෙන් වලකින්න)**
**මෙහි මුල් පිටපත් වෙන් වෙන් වශයෙන් රැගෙන ආ යුතුය.**

<u>2 දැනට ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය විසින් නිකුත් කරනු ලැබූ ක්‍රීඩක හැඳුනුම්පතක් සහිත වෙනත් පාසලක සිට දැනට ඉගෙනුම ලබන පාසලට පැමිණ ක්‍රීඩාකරන ක්‍රීඩකයෙකු සඳහා</u>

- මාර්ගගත ක්‍රමය ඔස්සේ ක්‍රීඩකයා ලියාපදිංචිය සිදුකර එමගින් ගනු ලැබූ ක්‍රීඩක ලියාපදිංචි පෝරමයේ පිටපත ( Player Registration Form )
- එම ශිෂ්‍යාගේ/ක්‍රීඩකයා හට ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය විසින් නිකුත් කරනු ලැබූ ක්‍රීඩක හැඳුනුම්පත
- අගල් 2'' 2 1/2'' ප්‍රමාණයේ ඡායාරූපයක් - එහි පිටුපස එම ක්‍රීඩකයාගේ නම /ඇතුළත්වීමේ අංකය / උපන් දිනය යොදා විදුහල්පතිතුමා විසින් සහතික කර තිබිය යුතුය.(**මාර්ගගත ක්‍රමය ඔස්සේ ක්‍රීඩක ලියාපදිංචිය සඳහා බාගත කරන ලද ඡායාරූපයම විය යුතුය.)**
- එම ක්‍රීඩකයාගේ ශිෂ්‍යකාර්ය දර්ශනය හා එහි පිටපතක් දැනට ඉගෙනුම ලබන පාසලේ විදුහල්පතිතුමන් විසින් සහතික කර රැගෙන ආ යුතුය.

- කලින් ඉගෙනුම ලැබූ පාසලෙන් නිකුත් කරනු ලැබූ වෙතත් පාසලකට ක්‍රීඩා කිරීම සම්බන්ධයෙන් විරෝධතාවයක් නොමැතිබවට සහතික කරන ලද ලිපිය හා එහි පිටපතක්
(No Objection Letter)

**ක්‍රීඩක ලියාපදිංචි පෝරමයේ පිටපත / ජායාරූපය / ශිෂ්‍යකාර්ය දර්ශනයේ පිටපත හා No Objection Letter පිටපත ඇමුණුම් කටු (Stepler Pins )යොදා අමුණා තිබිය යුතුය.( ෆයිල් කටු භාවිතා කිරීමෙන් වලකින්න)**
**මෙහි මුල් පිටපත් වෙන් වෙන් වශයෙන් රැගෙන ආ යුතුය.**

3 **<u>නවතම ක්‍රීඩකයෙක් /ශිෂ්‍යයෙක් සඳහා</u>**

3-1 **මෙම ක්‍රීඩකයා ශ්‍රී ලංකා පාසල් සංගමය මගින් සංවිධානය කරනු ලබන තරගාවලියක් සඳහා සහභාගී වන ප්‍රථම අවස්ථාව වන අතර ඔහු එම පාසලට ඇතුළත් වී වසරකට වඩා වැඩි කාලයක් නම්**

- මාර්ගගත ක්‍රමය ඔස්සේ ක්‍රීඩකයා ලියාපදිංචිය සිදුකර එමගින් ගනු ලැබූ ක්‍රීඩක ලියාපදිංචි පෝරමයේ පිටපත ( Player Registration Form )
- උප්පැන්න සහතිකය හා එහි පිටපතක්
- අගල් 2'' 2 1/2'' ප්‍රමාණයේ ජායාරූපයක් - එහි පිටුපස එම ක්‍රීඩකයාගේ නම /ඇතුළත්වීමේ අංකය / උපන් දිනය යොදා විදුහල්පතිතුමා විසින් සහතික කර තිබිය යුතුය.(**මාර්ගගත ක්‍රමය ඔස්සේ ක්‍රීඩක ලියාපදිංචිය සඳහා බාගත කරන ලද ජායාරූපයම විය යුතුය.)**

**ක්‍රීඩක ලියාපදිංචි පෝරමයේ පිටපත / උප්පැන්න සහතිකයේ පිටපත හා ජායාරූපය ඇමුණුම් කටු (Stepler Pins )යොදා අමුණා තිබිය යුතුය.( ෆයිල් කටු භාවිතා කිරීමෙන් වලකින්න)**

3-11 **යම් ක්‍රීඩකයෙකු දැනට සිටින පාසලට පැමිණ ක්‍රීඩකයින් ලියාපදිංචි කරන දිනට අවුරුද්දකට අඩු කාලයක් නම් (ඇතුළත් කර ඇත්තේ 6 හෝ 12 ශ්‍රේණි සඳහා නොවේනම්)**

- මාර්ගගත ක්‍රමය ඔස්සේ ක්‍රීඩකයා ලියාපදිංචිය සිදුකර එමගින් ගනු ලැබූ ක්‍රීඩක ලියාපදිංචි පෝරමයේ පිටපත
- උප්පැන්න සහතිකය හා එහි පිටපතක්
- අගල් 2'' 2 1/2'' ප්‍රමාණයේ ජායාරූපයක්
එහි පිටුපස එම ක්‍රීඩකයාගේ නම /ඇතුළත්වීමේ අංකය / උපන් දිනය යොදා විදුහල්පතිතුමා විසින් සහතික කර තිබිය යුතුය.(**මාර්ගගත ක්‍රමය ඔස්සේ ක්‍රීඩක ලියාපදිංචිය සඳහා බාගත කරන ලද ජායාරූපයම විය යුතුය.)**
- එම ක්‍රීඩකයාගේ ශිෂ්‍යකාර්ය දර්ශනය හා එහි පිටපතක් දැනට ඉගෙනුම ලබන පාසලේ විදුහල්පතිතුමන් විසින් සහතික කර රැගෙන ආ යුතුය.
- කලින් ඉගෙනුම ලැබූ පාසලෙන් නිකුත් කරනු ලැබූ වෙතත් පාසලකට ක්‍රීඩා කිරීම සම්බන්ධයෙන් විරෝධතාවයක් නොමැතිබවට සහතික කරන ලද ලිපිය හා එහි පිටපතක්
(No Objection Letter)

**ක්‍රීඩක ලියාපදිංචි පෝරමයේ පිටපත / උප්පැන්න සහතිකයේ පිටපත / ජායාරූපය / ශිෂ්‍යකාර්ය දර්ශනයේ පිටපත හා No Objection Letter පිටපත ඇමුණුම් කටු (Stepler Pins )යොදා අමුණා තිබිය යුතුය.( ෆයිල් කටු භාවිතා කිරීමෙන් වලකින්න)**

මෙම ක්‍රීඩකයින් ලියාපදිංචි කිරීමේ හා කණ්ඩායම් ලියාපදිංචිය පිළිබඳ වැඩිදුර තොරතුරු හා එය සිදු කරන ආකාරය පිළිබඳ දැනුවත් වීමට අපගේ www.schoolscricket.lk වෙබ් පිටුවටු පිවිසෙන්න.
www.schoolscricket.lk → Team Registration → Team & Player Registration Guidelines → Video Click Or User Guide
තවද,
**ඔබ විසින් ක්‍රීඩක හා කණ්ඩායම් ලියාපදිංචිය සඳහා අපගේ වෙබ් පිටුවට පිවිස පහත පියවර අනුගමනය කරන්න.**
www.schoolscricket.lk → Team Registration → slsca.batsman.com

ජේ.ඒ.කේ.එස්.ඉන්ද්‍රජිත්
ලේකම්